00034

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම 2014/2015

අවසාන පරීක්ෂණය - 2016

අධ්‍යාපන මනෝවිද්‍යාව – ESU3225

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2016 අප්‍රේල් 04 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. අධ්‍යාපන මනෝවිද්‍යාව සුදුසු නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. අධ්‍යාපන මනෝවිද්‍යාව, ගුරුභූමිකාව සාර්ථකව ඉටුකර ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන ආකාරය ගුරු භූමිකා තුනක් (03) ඇසුරින් කෙටියෙන් දක්වන්න.

03. සිසු චර්යා අධ්‍යයනය සඳහා ගුරුවරයෙකුට යොදාගත හැකි ක්‍රම ශිල්ප දෙකක් (02) නම් කර ඉන් එකක් (01) කෙටියෙන් පැහැදිලි කරන්න.

04. නව යෞවනයාගේ පෞරුෂ ගති ලක්ෂණ දෙකක් (02) පැහැදිලි කරන්න.

05. ඉගෙනීම සඳහා බලපාන සාධක දෙකක් (02) පැහැදිලි කරන්න.

06. "පූර්ණ සංවර්ධනය" යන්න අර්ථ කථනය කරන්න.

07. සිසුන්ගේ අවධානය දියුණු කිරීම සඳහා ගුරුවරයෙකුට යොදාගත හැකි උපාය මාර්ග පහක් (05) නම් කරන්න.

08. අධ්‍යාපන මනෝවිද්‍යාව විෂයය හැදෑරීමෙන් "නාට්‍ය හා රංග කලාව" ක්ෂෙත්‍රයට අදාලව ගුරුවරයෙකුට ලබා ගත හැකි වාසි තුනක් (03) නම් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. (i) පියාජේට අනුව වියුක්ත චින්තන අවධියේ පසුවන සිසුන්ගේ ප්‍රජානන සංවර්ධනයේ ගති ලක්ෂණ දෙකක් (02) උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii). එම අවධියේ පසුවන සිසුන්ගේ නිර්මාණශීලි හැකියා සංවර්ධනය සඳහා ඔබට යොදාගත හැකි ඉගෙනුම් ක්‍රියාකාරකම් දෙකක් (02) සංවිධානය කර විස්තර කරන්න. ඔබ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන නිර්මාණශීලි හැකියා සඳහන් කල යුතුය.

(ලකුණු 12)

10. (i) (a) චර්යාවාදී, ප්‍රජානන හා සමාජ ඉගෙනුම් න්‍යායය කාණ්ඩයන්ට අයත් වන එක් (01) න්‍යායයක් බැගින් දක්වන්න. (ලකුණු 03)

(b) ඔබ සඳහන් කරන ලද එක් එක් න්‍යායයේ ප්‍රධාන මූලධර්ම පැහැදිලි කර, එම මූලධර්ම ඇසුරින් ඉගෙනුම සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) ඉහත සඳහන් කරන ලද ඕනෑම න්‍යායයක් (01) තෝරාගෙන නාට්‍ය හා රංග කලාව විෂය ඉගෙනීම පහසු කිරීම සඳහා එම න්‍යායයේ මූලධර්ම යොදා ගත හැකි ආකාරය, උපාය මාර්ග දෙකක් (02) ඇසුරින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

11. (i) 'සංජානනය' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සංජානනය සඳහා බලපාන සාධක දෙකක් (02) නම් කරන්න. (ලකුණු 06)

(iii) සිසුන්ගේ නිවැරදි සංජානනය දියුණු කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම ශිල්ප හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) (a) නව යෞවනයන් මුහුණ දෙන චිත්තවේගී ගැටළු තුනක් (03) ක් දක්වන්න.

(ලකුණු 03)

(b) ඔබ ඉහත සඳහන් කල, නව යෞවනයන්ගේ චිත්තවේගී ගැටළු අවම කිරීම සඳහා නාට්‍ය හා රංග කලාව විෂයයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(ii) එම චිත්තවේගී ගැටළු අවම කිරීම සඳහා නාට්‍ය හා රංගකලාව විෂයය යොදා ගැනීමේ ගුරු භූමිකාව, නිදසුන් තුනක් (03) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

13. i) ස්මෘතිය යනු කුමක් ද? (ලකුණු 04)

ii) ස්මෘති හැකියා වර්ධනය කිරීමට යොදාගත හැකි ක්‍රම ශිල්ප දෙකක් (02) නම් කරන්න. (ලකුණු 04)

(iii) නාට්‍ය හා රංග කලාව විෂයය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඉහත නම් කරන ලද ක්‍රම ශිල්ප යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

14. පහත සඳහන් ඕනෑම තුනක් (03) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) පෙළඹවීම දියුණු කිරීම සඳහා මානුෂවාදී න්‍යායය භාවිතය
(ii) පෞරුෂය පිළිබඳ ෆොයිඩ් ගේ න්‍යායය
(iii) ළමයකුගේ ප්‍රජානන සංවර්ධනයට අදාලව 'අනුවර්තනය' හා 'සංවිධාන' ක්‍රියාවලින්.
(iv) ඉගෙනීම සහ පරිනතිය අතර ඇති සබඳතාවය

(ලකුණු 6 x3 +2 = 20)

හිමිකම් ඇවිරිණි.